PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS


2025.08.18

නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතා,

පොලිස්පති,

පොලිස් මූලස්ථානය,

කොළඹ 01.

හිතවත් පොලිස්පතිතුමනි,

**අභිනව පොලිස්පතිවරයා ලෙස පත්වීම පිළිබඳ පැෆ්රල් සංවිධානයේ සුභාශිංසන පිරිනැමීම.**

ශ්‍රී ලංකා පොලිසියේ 37 වන පොලිස්පතිවරයා ලෙස පත්වීම පිළිබඳව ඔබතුමා වෙත පැෆ්රල් සංවිධානයේ සුබපැතුම් පිරිනමමු. විශේෂයෙන්ම වසර 158 ක අභිමානවත් ඉතිහාසයක් සහිත පොලිස් සේවයේ පහළම තනතුරින් පටන් ගෙන ඉහළම තනතුර දක්වා පැමිණි එකම නිලධාරියා වශයෙන් සෑම තරාතිරමකම නිලධාරින්ගේ සිතුම් පැතුම් සහ ආකල්ප පිළිබඳව අවබෝධයක් සහිත අයෙකු ලෙස මහජන මිත්‍රශීලි පොලීසියක් නිර්මාණය කිරීමේ වගකීම වෙනුවෙන් උපරිමයෙන් කැපවන බවත් ඒ සඳහා සියලු තරාතිරම්වල පොලිස් නිලධාරින්ගේ සහයෝගය බලාපොරොත්තු වන බවත් වැඩ භාරගන්නා අවස්ථාවේදී ඔබතුමා සඳහන් කරන ලදී.

සැබැවින්ම රටේ නීතිය හා සාමය ආරක්ෂා කරමින් ජනජීවිත සුරක්ෂිත කිරීමේ වගකීම පැවරෙනුයේ පොලිස් දෙපාර්තමේන්තුව වෙතය. නමුත් අවාසනාවකට මෙන් පසුගිය කාලසීමාව තුළ පොලිසියේ ඉහළ තනතුරු දැරූ නිලධාරින්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් පොලිසියේ කීර්තිනාමයට එල්ල වුයේ බලවත් හානියකි. දැන් ඔබතුමා වෙත පැවරී ඇත්තේ මහජන විශ්වාසය දිනාගනිමින් පොලිස් දෙපාර්තමේන්තුව සතු අභිමානය ගොඩනැංවීම වෙනුවෙන් නොපසුබස්නා උත්සාහයකින් යුතුව කටයුතු කිරීමේ අවස්ථාවයි. ඔබතුමාගේ අතීත ක්‍රියාකාරකම් සහ වැඩබලන පොලිස්පතිවරයා ලෙස මෑත කාලීනව කටයුතු කල ආකාරය පිළිබඳව විමසා බැලීමේදී පෙනීයන්නේ ඒ සඳහා ඕනැවටත් වඩා සුදුසුකම ඔබ සතුව ඇති බවයි.

අවසන් වශයෙන් කිසිදු බලපෑමකට නතුනොවී හෘද සාක්ෂියට අනුව කටයුතු කරමින් මහජන මිත්‍රශීලි අභිමානවත් පොලීසියක් ගොඩනැංවීමටත් ඒ හරහා මහජනතාවට බියෙන් සැකෙන් තොරව ජීවත්විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමටත් හැකියාව ලැබේවායි ප්‍රර්ථනා කරමි.

රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යාක්ෂ


#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.

Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572

Email : paffrel@sltnet.lk Web : www.paffrel.com